**ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2024/2025**

ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතුය.) අතර සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ：

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුලු ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 ක් සම්මාන 03 ක් සහිත ව සමත් විය යුතුය.

තවද ඔහු හෝ ඇය,

*(අ)* පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙයින් මාස 06 ක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

*(ආ)* ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

*(ඇ)* පාසල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

*හෝ*

*(ඈ)* කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම

*හෝ*

*(ඉ)* ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම, එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

2. අයදුම්පත් එවීමේ ක්‍රමය :-

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 ½" ප්‍රමාණයේ කඩදසියක සකස් කර ගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර **2023.10.31** වැනි දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත ආකෘතිය ප්‍රකාර ව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''2024/2025 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව'' සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ සේවය, පළාත් රාජ්‍ය සේවය, සංස්ථාවල සේවයේ නියුතු නිලධාරින් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරා ගැනීම ：

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත්‍ර අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. පාඨමාලාව පිළිබඳ විස්තර ：

4.1 විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් සමන්විත වේ. ：

(අ) **පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත**
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රයෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථාවෝචිත පරිදි තෝරාගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය හා ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව **මාස 12 කි.**

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් රු. 60,000.00 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලා ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන් ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ''ලේකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, යටිතල පහසුකම්

සංවර්ධන අංශය''  යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ''ක්‍රීඩා ඩිප්ලෝමා'' සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. අනෙකුත් කොන්දේසි ඃ-

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළයුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2023 සැප්තැම්බර් මස 11 වැනි දින,
අංක 100/7 නිදහස් මාවත,
කොළඹ 07.